# ජනාධිපතිරණය අවුරුදු හතරේ සිමාව තුන්වෙනි සංශෝධනය අවුරුදු හයද? දොළහද?

අද මුළු රටේම කතා බහට ලක්වී ඇත්තේ මේ ප්‍රශ්නමාලාවය. ඒවා මෙතෙක් දවස් කරලියට නැඟී ආ "පොදු අපේක්ෂක" ප්‍රශ්නයටත් වඩා ජනතාවගේ කතා බහට භාජනය වී ඇති බව පෙනේ. මේ පිළිබඳ විග්‍රහ කරන්නේ නම් විධායක ජනාධිපති ක්‍රමයේ උපත දක්වා දිගෙක තුනක් ආපස්සට හැරීම ඉතා වැදගත් ය. ජාතියක අතීත ඉතිහාසය එක් එක් ඉතිහාස පදයට රුචි පරිදෙන් විකෘති කිරීමට 'බලපත්‍රයක් අවශ්‍ය නොවේ. එහෙත් නූතන තාක්ෂණික ලෝකයේ සමකාලීන ඉතිහාසය විකෘති කරන්නා දවසක් යන්නටත් පෙර 'බොරු කාරයෙකු' බවට පත්වෙයි.

1977 ජූලි මස පැවැත්වූ මහා මැතිවරණයේ දී එක්සත් ජාතික පක්ෂය පාර්ලිමේන්තුවේ ආසන 168 න් 140 ක් ම දිනාගත් විට ජන්ද දුන් ජනතාව පමණක් නොව එපාප නායකත්වය ද විස්මිත ප්‍රීතියකින් අන්දුන් කුන්දුන් වූහ.

ජනතාවගේ ජන්දයෙන් පූර්ණ විධායක බලතල ඇති ජාධිපතිවරයෙකු පත්කර ගත යුතු යැයි තීරණය කළ එපාපය ඒ සඳහා අලුත් ව්‍යවස්ථාවක් සම්මත කර ගත් නමුත් ජනාධිපතිවරණයක් පැවැත්වූයේ නැත. ඔවුන් කළේ අගමැති ජේ.ආර්.ජයවර්ධන මහතා පාර්ලිමේන්තු ජන්දයෙන්-පාර්ලිමේන්තුවේ 5/6 ක සම්මුතියෙන් / 78 පෙබරවාරි 4 දා අගමැති ජේ.ආර්.ජයවර්ධන ජනපති පදවියට පත්කර ගැනීමය.

මේ පත්වීම සිදුවීමටත් මාස 2 කට කලින් අවුරුදු 35 ක් තිස්සේ ජනතාවට (ළප්පත් ජනතාවට) 'පූජා පුස්තකයක්' බඳු වූ හාල්පොත අහෝසි කර තිබුණි.

සළාක පොත නැතිවීම නිසා ඉතා අසරණභාවයට පත් වූ ජනයා 1980 ජූලි මාසයේදී මහා වැඩවර්ජනයක් අරැඹූහ. ඒ වැඩ වර්ජනය සමථයකට පත් කිරීමට උත්සාහ කිරීමට වඩා මර්දනය යහපත් ආයුධයක් යැයි සිතූ ජනාධිපති ජයවර්ධන අසවල් දිනට වැඩට වාර්තා නොකළහොත් රැකියාවෙන් අස්කරන බවට අනතුරු ඇඟවීමක් කළේය. යටත් විජිත පාලන යුගයේ පටන් මෙබඳු අනතුරු ඇඟවීම් නිකුත් කරන ලද නමුත් ඒවා කිසිම රජයක් අතුරටම ක්‍රියාත්මක කළේ නැත.

එහෙත් ජනාධිපති ජයවර්ධන 'තමා කියන දේ කරන, කරන දේ කියන' රාජ්‍ය නායකයෙකු බව ඔප්පු කිරීමට තර්ජනය ක්‍රියාවට නැංවීය. දහස් ගණන් රාජ්‍ය සේවකයන්ට රැකියා අහිමි වීය. ඇතැම්හු සියදිවි නසා ගත්හ. සළාක පොතකුත් නැති බොහෝ දරු පවුල් අනාථ භාවයට පත්වූහ.

මේ සිද්ධියෙන් පසු ජනතා ප්‍රසාදය ක්‍රමයෙන් වැඩි වන්නට වී ය.

හිටපු අගමැතිනී බණ්ඩාරනායක මැතිනියගෙ " ප්‍රජා අයිතිය නැති කිරීමෙන් පසු තමාටපුබල අභියෝගයක් එලලා නොවනු ඇතැයි විශ්වාස කළ ජයවර්ධන මහතා 'නින්දෙන් අවදි වූයේ 1981 පොලීසියේ සම්මන්ත්‍රණ වාර්තා කියවූ විටය.

එම සම්මන්ත්‍රණ වාර්තාවලින් කියවුණේ ආණ්ඩුවේ ජනප්‍රියතාවය ශිෂ්‍යයෙන් පහළ බසින බවත් 1982 අවසන් වන විට අපේක්ෂකයා කවුරුන් වුණත් තරගය 'කරට කර' යා හැකි බවත් ය.

මේ අනතුරු ඇඟවීමෙන් පසු ජනාධිපතිවරයාගේ උපදේශක කණ්ඩායමේ 'තියුණු මොළකාරයා' වූ ජී.වී.පී. සමරසිංහ (පුටුස්) මහතා කඩිමි අදහසක් ඉදිරිපත් කළේය.

පදවිය දරන ජනාධිපතිවරයා තවත් නිල කාලයක් සඳහා ඉදිරිපත් වන්නේ නම් පදවියට පත් වී අවුරුදු 4 අවසන් වූ විට දෙවන ජනාධිපතිවරණය ද පැවැත්විය හැකිය"

තුන්වන සංශෝධනය උපන්නේත් 1982 ඔක්තෝබර් මාසයේ ජනතා ජන්දයෙන් ජනාධිපති තෝරන පළමුවන ජනපතිවරණය පැවැත්වුණේත් මේ සංශෝධනයට අනුකූලවය.

1982 ජනාධිපතිවරණය

ජනාධිපතිවරණය සඳහා නාම යෝජනා පත්‍ර භාර ගැනීමේ දිනය වූයේ 1982 සැප්. 17 (ජයවර්ධන මහතාගේ 76 වන ජන්ම දිනය) දාට ය. ජන්ද විමසීම ඔක්. 20 දාට නියම කරන ලදී. ජනාධිපතිවරයාට විරුද්ධව පොදු අපේක්ෂකයෙකු තෝරා ගැනීම සඳහා වැඩිපුරම වෑයම් කළේ ලංකා කොමියුනිස්ට් පක්ෂයයි. එය සාර්ථක නොවී ය. අවසානයේදී හෙක්ටර් කොබ්බෑකඩුව (ශ්‍රී.ල.නි.ප) රෝහණ විජේවීර දිලා තියෙනවා කියලා. එතකොට උන්නැහේ කොන්තරාත්කාරයෙක්. හරියට මේ PWD කොන්තරාත් කාරයෝ වගේ. PWD කොන්තරත්කාරයන්ට බෑ රටක් පාලනය කොරන්න''

ඔක්තෝබර් වැනිදා පැවැති මැතිවරණයේ ප්‍රතිඵල ගලා එන් ම පනාධිපති කඳවුරේ දකින්නට ලැබුණේ චකිතයට මුසු වූ ප්‍රීතියකි. චකිතයට හේතු වූ කරුණු බොහොමයක් තිබේ. කොළඹ සහ යාපනේ ගණන් කිරීමේ මධ්‍යස්ථානවලින් ලැබුණු ආරංචිවලින් කියැවුණේ කුමාර් පොන්නම්බලම්, කොල්වින් ආර්. ද සිල්වා, සහ වාසුදේව නානායක්කාර යන අපේක්ෂකයන් තුන්දෙනාට දී ඇති ජන්ද පත්‍රිකා සියල්ලේම පාහෝ දෙවන මනාපය කොබ්බෑකඩුව මහතාට ලකුණු කර ඇති බවය. විජේවීර මහතාට දී ඇති ජන්ද පත්‍රිකාවල මනාප බොහොමයක දෙවන මනාපය ලකුණු කර නොමැති අතර ලකුණු කර ඇති ඒවායේ ද වැඩි කොටස් කොබ්බෑකඩුව මහතාට ලකුණු කර ඇති බවය. අවසාන ජන්ද ප්‍රතිඵලවලින් පෙන්නුම් කළේ යාපනය දිස්ත්‍රික්කයේ දෙමළ එක්සත් පෙරමුණ ජන්දය වර්ජනය කළත් ජයවර්ධන මහතා එහි අන්ත පරාජයක් ලැබූ බවය. එම දිස්ත්‍රික්කයේ ලියා පදිංචි ජන්ද ඇත්තේ දෙලක්ෂ විසි අට දාස් හසයිය දහතුනක් පමණි. එයින් ජනාධිපති ජයවර්ධනට ලැබුණේ ජන්ද හතලිස් හතරදාස් හත්සිය අසූවකි. කොබ්බෑකඩුව මහතා හැත්තෑ හත්දාස් තුන්සියයක් ලබා ගන්නා අතර පොන්නම්බලම් මහතා මුල් තැන ගත්තේ ජන්ද අසූහත්දහස් දෙසිය හැට තුනක් ලබමිනි.

ළසසප. ජ.වි.පෙ. නවලස්සප පක්ෂ තුනට ද ජන්ද අටදාහක් පමණ ලැබූ තිබුණි. අවසාන ප්‍රතිඵලයේදී ජයවර්ධන මහතාට 52.91% ක් ද කොබ්බෑකඩුව මහතාට ජන්ද 39දු07% ක් ද රෝහණ විජේවීර මහතාට ජන්ද 4.09% ක්ද අනෙක් අපේක්ෂකයන් තිදෙනාට 0.4% ක් ද ලැබී තිබුණේය.

ජයග්‍රහණය ලැබුණ ද මේ ප්‍රතිඵලය ජනාධිපති කඳවුරට ගෙන ආවේ චකිතයකි.

වහාම පාර්ලිමේන්තු මැතිවරණයක් පැවැත්වුවහොත් තම අනුපාතික ජන්දක්‍රමය යටතේ පාර්ලිමේන්තුවේ බහුතරයක් ලබා ගැනීම ඉතා දුෂ්කර වන බව සක් සුදක් සේ පහැදිලි වීය. නොවරදවාම බල තුලනය උතුරු පළාතට හිමිවන බව කාගේත් විශ්වාසය වූයේය. මීට ප්‍රතිකර්මයක් වශයෙන් උපදේශකයන් කියා සිටියේ ජනමත විචාරණයක් පවත්වා පාර්ලිමේන්තුවේ ආයුකාලය තවත් සය වසරකින් දීර්ඝ කර ගත යුතු බවය. ඒ අනුව ජනමත විචාරණය සඳහා පරස්පර විරෝධී හේතු කිහිපයක් ජනාධිපතිවරයා ඉදිරිපත් කළේය.

රූපවාහිනියෙන් කතා කළ ජනාධිපතිවරයා කියා සිටියේ ජනාධිපති වරණයේදී තමා ඝාතනය කිරීමට කුමන්ත්‍රණයක් තිබූ බවට පොලීසියට ඔත්තු ලැබී ඇති බවය. මැතිවරණයක් පැවැත්වුවහොත් 'නක්සලයිට්' මත ධාරී කුමන්ත්‍රණකරුවන් රාශියක් පාර්ලිමේන්තුවට ඇතුළුවනු නිසැකය. එය වැළැක්වීමට හැකි එකම ක්‍රමය පාර්ලිමේන්තුවේ කාලය දීර්ඝ කිරීමෙන් පමණකි.

මේ වෝදනාව අමූලික බොරුවක් බව එප්පු වූයේ ඒ වෝදනා මත සිරභාරයට ගන්නා ලද විජය කුමාරණතුංග වර්තමාන අගමැති රත්නසිරි වික්‍රමනායක ඇතුළු පිරිස කිසිම චෝදනාවක් නැතිව නිදහස් කළ නිසාය. )

මේ ජනමත විචාරණ ව්‍යාපාරයේ දී රජය දුන් පොරොන්දු එකිනෙක විස්තර කිරීම කාල නාස්තියකි. එහෙත් එක් පොරොන්දුවක් පමණක් සඳහන් කිරීම ඉතා වැදගත්ය.

1987 දී ලේක්හවුසියෙන් ප්‍රකාශයට පත්කරන ලද Parliament of Sri Änka" නමැති පොතේ එන වැකියක් මෙසේය.

"President Jayawardena Compared Present government to a five years the child would grow taller. In 15 years, the country would develop much that evry house would have the Opportunity of Owning a T.V. Set. He said the government should be power for 15 years.

තම රජය අවුරුදු හතරක බිල්ලෙක් පමණක් බවත්, පොරොන්දු ඉටු කිරීමට රජයකට වසර 15 ක්වත් අවශ්‍ය බවත් හා ඉදිරි සය වසර තුල සෑම නිවසකටම ටෙලිවිෂනයක් ලබා දීමට හැකි බවත් මෙහි කියවේ. (38 වැනි පිටුව)

ජනමත විචාරණය පැවැත්වූ අන්දම ගැන වැඩි වාර්තා අනවශ්‍යය. එය ලංකා ඉතිහාසයේ කුසුකටම මැතිවරණය හා "ජන්ද ඝාතනය (Rape of the Ballot) උපන්නේ ඒ ජනමත විචාරණයෙන් බව වාර්තාගතය. උදාහරණ කිහිපයක් පමණක් පෙන්වා දීමට කැමැත්තෙමි.

ඔක්තෝබර් 20 දා ජනාධිපතිවරණයේදී ජන්ද 25 ලක්ෂයක් ලබාගත් හෙක්ටර් කොබ්බෑකඩුව මහතා හා තිස්වසරක් පාර්ලිමේන්තු ආසනය හෙබැවූ කොමියුනිස්ට් පක්ෂයේ නායක පීටර් කෙනමන් මහතාත් ජන්ද p5කාශ කරන්නට යන විට ඒ ජන්ද වෙනත් පුද්ගලයන් විසින් දමා ඇති බව ඔවුන්ට දන්වන ලදී. එබඳු ජන්ද දැමීම් දහස් ගණනක් කොළඹ නගරයෙන් වාර්තා වීය.

මීට වඩා විස්මය ජනක සිද්ධියක් වාර්තා වූයේ ගම්පහ දිස්ත්‍රික්කයෙනි. ගම්පහ දිස්ත්‍රික්කයේ එපාප ප්‍රධාන සංවිධායකයා වූයේ බියගම මිනත්‍රී රනිල් වික්‍රමසිංහ ඇමතිවරයා ය.

ඔක්තෝබර් 20 දා ජනාධිපතිවරණයේදී ශ්‍ර ල නි ප ය අත්තනගල්ල ආසනය ජයග්‍රහණය කළේ වැඩි ජන්ද නමදාතකිනි. කොබ්බෑකඩුව මහතා ජන්ද 31,495 ක් ලබද්දී ජයවර්ධන මහතාට ලැබුණේ 22521 ක් පමණකි. අනෙක් එපාප විරෝධී අපේක්ෂයන්ට ජන්ද 2000 ක් පමණ ලැබී තිබුණි. එහෙත් දොස.22 දා ජනමත විචාරණයේදී එපාපයට පක්ෂව ජන්ද 35,747 ක් ලැබෙන අතර ඊට විරුද්ධව ලැබුණේ ඉන් අඩකටත් අඩු වූ ජන්ද 17442 ක් පමණකි. යාබද දොම්පේ ආසනයේ ඔක්තෝබර් 20 දා කොබ්බෑකඩුව මහතා ජයවර්ධන මහතාට වඩා ජන්ද 1000 ක් ලබා ගත්තේය. එහෙත් ජනමත විචාරණයේදී එපාපයට පක්ෂව ජන්ද 30138 ක් ලැබෙද්දී විරුද්ධව ලැබුණේ 19439 ක් පමණි.

මේ සියලු කරුණු හෙළිකරන්නට සිදුවූයේ එපාපය අද තමන් විසින්ම නිර්මාණය කරන ලද විධායක ජනාධිපතික්‍රමය අහෝසි කිරීමට උද්ඝෝෂනය කරන බැවිනි. ඔවුන්ගේ උද්ඝෝෂනයේ සරල තේරුම කුමක්ද?

අපි නිර්මාණය කල විධායක ජනාධිපති ක්‍රමය, ජන්ද කොල්ලය ආදිය තුක්තිවිදීමේ පොලමස ද්ම්නිත්‍රිකාර, උරුමක්කාර බලය ඇත්තේ අපට මිස අන්කිසිවෙකුට නොවේයන්නය.

**සළාක පොත නැතිවීම නිසා ඉතා අසරණභාවයට පත් වූ ජනයා 1980 ජූලි මාසයේදී මහා වැඩවර්ජනයක් අරැඹූහ. ඒ වැඩ වර්ජනය සමථයකට පත් කිරීමට උත්සාහ කිරීමට වඩා මර්දනය යහපත් ආයුධයක් යැයි සිතූ ජනාධිපති ජයවර්ධන අසවල් දිනට වැඩට වාර්තා නොකළහොත් රැකියාවෙන් අස්කරන බවට අනතුරු ඇඟවීමක් කළේය. යටත් විජිත පාලන යුගයේ පටන් මෙබඳු අනතුරු ඇඟවීම් නිකුත් කරන ලද නමුත් ඒවා කිසිම රජයක් අතුරටම ක්‍රියාත්මක කළේ නැත.**

ඉන්දියාවේ හිටපු හිගෝස්ය මහ කොමසාරිස්

එස්. පියසේන